එම දේශනවලින් පසු ඔබ සැම කාන්ඩ 3 කට බෙදී ඔබලා සමග අප පරිසර විද්‍යාව ඉගැන්වීමේදී මුහුන පා ඇති ගැටළු සහ දුෂ්කරතාවන් හා ඒවා නිරාකරණය කර ගැනීමට ගත යුතු පියවර ගැනත් පැය 2 1/2 ක පමණ කාලයක් සාකච්ඡා කරන්න බලාපොරොත්තු වෙනවා. එම පැය 2 1/2 මෙම වැඩ මුළුවේ ඉතාමත්ම වැදගත් අවස්ථාවක් වෙනවා.

එය අවසන් වූ පසු ඔබට වන සංරක්ෂන දෙපාර්තමේන්තුවේ උපේක්ෂා හෙට්ටිගේ මහත්මිය විසින් වනජීවීන් සංරක්ෂණය කල යුත්තේ මන්ද යන තේමාව පිළිබඳව ස්ලයිඩ්ස් පට ආශ්‍රයෙන් කථාවක් ඉදිරිපත් කරනවා ඇත.

වැඩ මුළුව අවසන් වන්නේ දවස තුල ඔබ ඉදිරිපත් කරන යෝජනා සහ නිර්දේශ ගැන වැඩි දුරටත් සාකච්ඡා කිරීමෙන් පසුවයි. ස්තූතියි.

## පරිසර/සංරක්ෂණ අධ්‍යාපන පිළිබඳ අත්දැකීම් හා පරමාර්ථ

ආචාර්ය ඇස්. ඩබ්ලිව් කොටගම
(අධ්‍යක්ෂක, වන ජීවි දෙපාර්තමේන්තුව)

**මූලසූත කථාව**

පරිසර අධ්‍යාපනය සාර්ථක කිරීමට උත්සාහ කරලා තියෙනවා, නමුත් අපට තාම හැකියාවක් ලැබිලා නැහැ අපි බලාපොරොත්තුවන තරමට සංරක්ෂණ කාර්‍යයන් ඉෂ්ඨ කර ගැනීමට. විශේෂයෙන් සංරක්ෂණ අධ්‍යාපනය ගැන සමහර වේලාවට අධ්‍යාපන වේදීන් සඳහන් කරනවා ඇති මෙය විෂය මාලාවේ අඩංගුවෙලා තියෙනවා. එම නිසා ආයිත් කියන්න දෙයක් නැහැ මේක සාර්ථක වෙනවා කියලා. නමුත් මම දැකලා තියෙනවා පරිසරය කියන විෂයේ තියෙනවා ප්‍රදේශයේ ඉන්න කුරුල්ලන් ගැන අධ්‍යයනයක් කරන්න කියා. නමුත් ඒ එක්කම ලියපු පතපොත මම දැකලා තියෙනවා, නෙත් කලාපයේ වියලිකලාපීය කුරුල්ලන්ගේත්, පැලෑටි වලත් නම් ලියලා තියෙනවා. දැන් මෙතනින් මූලික වශයෙන් මම අදහස් කරන්නේ අපි බලාපොරොත්තු වනවාට වඩා වෙනස් විදියකින් තමයි අද සංරක්ෂණ අධ්‍යාපනය ක්‍රියාත්මක වන්නේ. අතික් එක සංරක්ෂණ අධ්‍යාපනය ගැන සෑහෙන කාලයක් අපි වෙහෙසිලා තියෙනවා. ගුරුවරු එක්ක ක්‍රියා කරන්න. එවිට බොහෝ වේලාවට නොයෙකුත් ප්‍රශ්න මතුවී තිබෙනවා. දැන් මේ වැඩමුළුවෙන් ප්‍රධාන වශයෙන් බලාපොරොත්තු වන්නේ එම ප්‍රශ්න හඳුනා ගෙන ඒවාට පිළියම් යොදා ගැනීමට උපාය මාර්ග යොදා ගැනීමයි. රජයේ නොවන ආයතනයක් හා නරේසා ( NARESA ) ආයතනය එකතුව, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව මෙම වැඩ-මුළුව සංවිධානය කර තිබෙනවා. ඉදිරි කාලයේදී සංරක්ෂණ අධ්‍යාපනයට ලැබෙන මුදල් ප්‍රමාණය දැනට වඩා අති විශාල වෙයි. ඒ නිසා එය උපරිම වශයෙන් ප්‍රයෝජනයට ගන්න පුළුවන් විදියට වැඩපිළිවෙලක් යකස් කළ යුතුයි. අතීතයේ අපට මතක ඇති, ක්ෂේත්‍ර මධ්‍යස්ථාන තිබුණා 06 ක් පමණ. නමුත් එකක්වත් දැන් ක්‍රියාකාරී නැහැ. මේවා නැවත ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතා වක් තියෙනවා. අධ්‍යාපන රටාවේ වැරැද්දක් තියෙනවා නම් ඔබ බය නැතිව කරුණු ඉදිරිපත් කරන්න. මොකද වඩා වැදගත් වෙනවා ඉදිරියට අපි මේවාට පිළියම් යොදන්නේ කොහොමද කියා සෙවීම.

කුඩා කල අපි දරුවන්ට කියන්නේ ප්‍රාථමික පන්තියේදී උගන්වන්න එපා. ඉගෙන ගන්න දෙන්න. මේ කියන ප්‍රතිපත්තිය අපි පිළිපදින්න ඕනැ. මෙතැනදී ගුරුභවතුන්ගේ දැනුවත්කම ඉතාම වැදගත්. දෙවනුව මම විශ්වාය කරනවා ඒ අය සමග ඉගෙන ගන්න ලැස්තිවෙලා ඉන්න ඕනැ. ඒ ලක්ෂණ ස්වභාව අධ්‍යයන කරන හෝ උගන්වන ඕනැම ගුරුභවතෙකු වෙත

තිබිය යුතුයි. Learning while teaching කියන උගන්වන ගමන් ඉගෙන ගැනීමේ ලක්ෂණය තියෙන්න ඕනෑ. ප්‍රශ්නයක් ඇහුවොත් ශිෂ්‍යයෙක් මිස් මේක මොකක්ද? නැත්නම් සර් මේක මොකක්ද? කියල, ඒක මම දන්නේ නැහැ කියන එක නොවේ ක්‍රියා මාර්ගය විය යුත්තේ. ඒක මොකක්ද කියල සොයල බලමු කියන එක. එහෙම නැතිව වෙන විදියකට ස්වභාව අධ්‍යයනය ශිෂ්‍යයන්ට ලබා දෙන්න බැහැ. මොකද මම හිතන්නේ නැහැ මොනම ගුරුවරයෙක්වත්, මම ඇතුළුව, ස්වභාවයේ තියෙන හැම දෙයක්ම දන්නවා කියල.

අපි කියනවා ස්වභාවය විශ්මය ජනක දෙයක් කියා. එම නිසා එම ස්ථාවරය මතම කිසිම ගුරු භවතෙකු හෝ ශිෂ්‍යයෙකුට සියල්ල දැනගැනීමේ හැකියාවක් නැහැ. එහෙනම් ඉගෙන ගැනීම උගන්වන ගමන් සිද්ධ වෙන්න ඕනෑ. එම නිසා ස්වභාව අධ්‍යයනයේදි ගුරුවරයෙකුගෙන් අහන ප්‍රශ්නය ගුරුවරයාගේ දැනුම් මිනුම් කරගන්න උත්සාහයක් නොවෙයි කියලා පිලිගන්න ලැහැස්ති වෙන්න ඕනෑ. සමහර විට මේක කරන්න පුළුවන් ශිෂ්‍යයින්, අපි දන්නවා මෙය සමහර විට අපිටත් කරලා තියෙනවා. නමුත් මෙතන වැදගත්කම වන්නේ මෙහිදී ගන්න ක්‍රියා මාර්ගය.

ක්ෂේත්‍රය තුල ඉගෙනීම මුල් ප්‍රාථමික කාලයේදි වැදගත්ම දෙයක්. ඒක නිසා තමා ඔයගොල්ලන්ගේ විෂය මාලාවේ ඒක ඒ විදියට අඩංගු කරලා තියෙන්නේ, පන්තියෙන් පිට පරිසර අධ්‍යාපනය කරන්න, ක්ෂේත්‍ර ගවේෂණය කරන්න, පාසැල් අවට තියෙන ගස් කොලන් ගැන අවබෝධයක් ලබා ගන්න ක්‍රියා කරන්න කියලා. විෂය මාලාවේ තියෙන බව මම හොඳට දන්නවා. ඊලඟට ද්විතියික තත්වයට එනකොට දැනුම වැඩිවීම නිසාත්, දැනුම වැඩි කර ගැනීමේ අවශ්‍යතා වය නිසාත් අපි කියනවා පරිසරය ගැන අධ්‍යයනය කරන්න කියලා. ඉස්සෙල්ලා පරිසරයෙන් අධ්‍යයනය කෙරුවා. දැන් කියනවා පරිසරය ගැන අධ්‍යයනය කරන්න කියලා. තුන්වෙනි අදියර තමයි පරිසරය වෙනුවෙන් අධ්‍යයනය කිරීම. මේ කොටස් තුන සාමාන්‍යයෙන් ස්වභාව අධ්‍යයනයේදි අන්තර්ගත වන ප්‍රධානතම කොටස් තුන. ඉස්සෙල්ලාම පරිසරයෙන්, ඊට පස්සේ පරිසරය ගැන, තෙවනුව පරිසරය වෙනුවෙන්. මෙතැනදි මා හිතන්නේ අපි මූලික වශයෙන් බලාපොරොත්තු වන්නේ පරිසරයෙන් අධ්‍යයනය කිරීම හා පරිසරය අධ්‍යයනය කිරීම. ප්‍රාථමික හා ද්විතියික මට්ටම් වලට ඒ වෙනස හඳුනා ගැනීම ඉතා ම වැදගත්.
අපි විශ්වාස කරන්නේ ස්වභාව අධ්‍යයනය පරිසරයෙන් හරියට කෙරුවොත්, පරිසරය ගැන අධ්‍යයනය කිරීම පහසු වෙනවා කියල. පරිසරයෙන් අධ්‍යයනය නොකරපු කෙනෙකුට පරිසරය

ගැන අධ්‍යයනය කිරීමට උපකාර කිරීම බොහෝම අපහසු කාර්යයක්.

තවද ගමේ දේශීය වෛද්‍ය වරයකුගෙන් ඇසුවොත් යම් කිසි පැලයක් කුමක්ද කියා ඔහු එය හඳුනා ගනීවි. නමුත් ඔහුට අපහසු වනවා තව කෙනෙකුට මෙය වෙන පැලයකින් වෙනස්වන්නේ කෙසේද කියා සවිස්ථරව කියා දීමට. නමුත් විද්‍යාවෙන් අපි මෙය විද්‍යාත්මකව වෙන පැලයකින් වෙන කොළයකින් හඳුනා ගන්නා හැටි කියා දෙනවා. මෙනිසා තමයි අපි පරිසර අධ්‍යයනය විද්‍යාත්මකව කල යුත්තේ.

1928 දී ස්වභාව අධ්‍යයනය කියලා විෂයයක් ලංකාවේ විෂය මාලාවේ තිබුණා. ඒ කාලේ මෙයට කිව්වේ 'School nature studies" කියලා. මෙම විෂයේ කරන්න ඕනෙ මොනවද කියන එක පතපොතෙහි තියෙනවා. සමහර විට මේවා පුස්තකාලවල ඇති. මම ඒ පොත පත දැකලා තියෙනවා. නමුත් අපි ඒවා ඔක්කෝම අමතක කෙරුවා. අද මම දකින්නේ විෂය මාලාව තුල තියෙන්නේ ප්‍රමාණයක් ( quantity ) පමණයි. හැම එකම ඉගෙන ගන්න කියනවා. වේගය, ප්‍රමාණය මිණුම් කරන්නේ වමාරන ප්‍රමාණය අනුවයි. විශ්ලේෂණ දැනුම උඩ නොවේ. මේක මා හිතන්නේ මුළු අධ්‍යාපනයේම තියෙන වැරැද්දක්. ඒවා දැන් මම හිතන්නේ වෙනස් කර ගෙන යන්න කවුරුත් උත්සාහ කරනවා. නමුත් ස්වභාව අධ්‍යයනයේදී මේක ඉතාමත්ම වැදගත්. නිකම් ඉගෙන ගැනීම නොවෙයි වැදගත් වන්නේ අවස්ථා නුකූලව මතක තබා ගැනීමයි.

එම නිසා මේ අවස්ථා වේදී පුළුවන් තරම් පුළුල් ලෙස කල්පනා කරන්න . සංරක්‍ෂණයට, අධ්‍යාපනයට මුදල් ඕන තරම් තියෙනවා. අපිට රටේ නැති උනාට මුදල් දෙන්න ලෝකයේ මිනිස්සු ඕන තරම් ඉන්නවා. අවශ්‍ය දේ ඔයගොල්ලෝ ඉදිරිපත් කරලා දෙනවානම්, මම හිතන්නේ අධ්‍යාපන දෙපාර්තමේන්තුව විරුද්ධ නොවන විදියට අපි සකස් කරලා රජයේ ආයතන මගින් නැවත ඔයගොල්ලන්ගේ බලාපොරොත්තු ඉෂ්ඨ වන විදියට ක්‍රියා කරන්න පුළුවන්. මම අද ඉන්න ඒ තිල තනතුර යටතේ යම් දේවල් ක්‍රියාත්මක කිරීමට සැළසුම් කර ගෙන යනවා. එම නිසා මගේ අදහස් වලට වැඩිය ඔබේ අදහස් ඉදිරිපත් කළොත් වැදගත්, මොකද ඔයගොල්ල තමයි ඒ අදහස් ක්‍රියාත්මක කරන්නේ. එම නිසා බය නැතිව තියෙන ප්‍රශ්න සඳහන් කරන්න. සමහර විට අවශ්‍ය වෙන්න පුළුවන් ඉතා සීඝ්‍රයෙන් ස්වභාව අධ්‍යයනය කරන පුද්ගලයන්ට නැත්නම් සංරක්‍ෂණය අධ්‍යයනය කරන පුද්ගලයන්ට පුහුණුව ලබා දීමට, ඒ පුහුණුවීම් ලබා දීමට ක්‍ෂෙත්‍ර ස්ථාන අවශ්‍ය නම් මම සපයන්න කැමතියි. වන උද්‍යාන වෙන්න පුළුවන් , අභයභූමි වෙන්න පුළුවන්, ඒ ස්ථානවලට කට්ටිය ගෙන්නලා, වරකට 25 – 30 ක් වේගයෙන් පුහුණු කරන්න වුනත් අපට පුළුවන්. අවුරුද්ද මුළුල්ලේම දිගටම

කරගෙන යන වැඩසටහනක් පිළියෙල කරන්න අවශ්‍ය නම් එය පිළියෙල කරන්න අවශ්‍ය ක්ෂේත්‍ර ස්ථාන ( field stations/field places ) සපයන්න මම කැමතියි. මොකද මෙය අත්‍යාවශ්‍යයි.

හුඟක් වෙලාවට අධ්‍යාපන දෙපාර්තමේන්තුව සංරක්ෂණ අධ්‍යාපනය පිළිබඳව තනිවම වැඩ කරනවා. මේ අතර සංරක්ෂණ දෙපාර්තමේන්තුවත් තනියම වැඩ කරනවා. නමුත් දැන් අධ්‍යාපන දෙපාර්තමේන්තුව තුලත් යම් යම් වෙනස්කම් කරගෙන යන නිසා අපිට ආයතනික වශයෙන් NARESA ආයතනයේ සහයෝගය ඇතිව මෙයින් පැමිණෙන දෙයක් හැටියට පිළි අරගෙන අපිට අළුතින් හිතලා අලුත් සම්බන්ධීකරණයක් තුලින් අවශ්‍ය වැඩ පිළිවෙල සකස් කරන්න හැකියාව තිබෙනවා. එහි සීමාවක් නැහැ කියන පරමාර්ථය තුලින් වැඩ කරන්න ඔයගොල්ලෝ පටන් ගන්න ඕනේ. එතකොට දැන් තියෙන සීමාවන් මොනවද කියන එක අවබෝධ වෙයි. ඒවායෙන් එළියට එන්නේ කොහොමද කියන එකත් එවිට හිතා ගන්න පුළුවන්.

තුන්වෙනුව මම කියන්න ඕනේ ස්වභාව සංරක්ෂණ අධ්‍යයනයේදි පටන් ගැනීමේදිම යමක් කරන්න බැහැ කියන ප්‍රතිපත්තියෙන් පටන් ගන්න බැහැ. හුඟක් අය හිතන්නේ වැඩ මුළුවට ආවනම ඕවා හැමදාම කතා කරන දේවල්, මේවා කරන්න බැහැ. අපි ඒකට කියනවා ( Negative approach ) කියලා. එහෙම නෙමේ ස්වභාව සංරක්ෂණය අධ්‍යාපනය කියන්නේ . කරන්න පුළුවන් දෙයක් යැයි සිතන්න. මොකද අධ්‍යාපනය දීම ඕනෑම කෙනෙකුට කරන්න පුළුවන් දෙයක්. බැරි දෙයක් නොවෙයි. කරවන්න බැරි වෙන්න පුළුවන්. නමුත් කරන්න පුළුවන්. එම නිසා ඉදිරියට හිතලා කල්පනා කරන්න. මෙය කරන්න පුළුවන් කියන අඩිතාලම මත මේ වැඩමුළුවෙ වැඩ පටන් ගත්තොත් වෙනත් වැඩමුළුවලට වඩා සාර්ථක ලෙස අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමේ හැකියාවක් තිබෙනවා යැයි මගේ විශ්වාසයයි.

සංරක්ෂණ අධ්‍යාපනයේ සාර්ථකත්වය සඳහා, මෙය විවෘත සංවාදයක් හැටියට හඳුනා ගැනීමට අවශ්‍ය යයි කියා කරුණාකරලා සිතේ තබා ගන්න. දැන් මා කෙලින්ම ඔබට කියනවා මගේ ආයතනයේ තියෙන අපහසු තාවයන් මොනවාද කියලා. මට මිනිස් ශක්තිය නැහැ. මුදල් ශක්තිය දැන් නැති වුනත් මට ලබා දෙන්න පුළුවන් කියලා මම විශ්වාසයක් ඇතිව කියනවා. ඒ වගේ මම දැන් ඔබට කිව්වා ක්ෂේත්‍ර ස්ථාන ඕනෑම ප්‍රමාණයක් ලබා දෙන්න මම ලැහැස්තියි.

පාසැල් අවට අභයභූමි තියෙනවා. සමහර තැන්වල . නමුත් ඒවා පාපිච්චි කරලා නැහැ.

1956 අපේ දෙපාර්තමේන්තුවේ ක්‍රියාත්මක වෙච්ච දෙයක් යටපත් වුණා. මෙය තමි හැම පාසැලකම සංරක්‍ෂණ ස්වේච්ඡා නිලධාරීන් දෙදෙනෙක් පත් කිරීම. දැන් ඒක නැවත ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා. මෙයින් අදහස් කරන්නේ, අවුම වශයෙන් අපේ රටේ පාසැල් 3000ක් විතර තියෙනවා. ඒ 3000 න් දෙදෙනෙක් අපි කියනවා (Voluntary Wardens) කියලා. ස්වේච්ඡා නිල නියාමක වශයෙන් පත් වුනොත් , ඒ දෙදෙනා වටා තව දෙදෙනෙක් හරි රොක් වුනොත්, එතකොට 6000 ක් හෝ ඊට අධික ප්‍රමාණයක් සමහරවිට පාසැල් තුලම ඇති වේවි. ස්වාභාවික අධ්‍යයන තුලම සංවිධාන ඇති වෙන්න පුළුවන්. දැන් අපේ විෂය චක්‍රලේඛණ ( Circulars ) තියෙනවා. සෑම පාසැලකම සංරක්‍ෂණය සංවිධාන තිබිය යුතු බවට . මෙම චක්‍ර ලේඛන යවලා තියෙනවා. නමුත් ඒවා පාසැල් කියකද ක්‍රියාත්මක වන්නේ ? අප හැම වේලේම කියන්නේ මේකට ගුරුවරයෙක් ඕන කියල. ගුරුවරයෙක් ඉන්න ඕනෙ විනය සඳහා, මිලමුදල් පරිහරණය සඳහා, නමුත් සංවිධානයට ශිෂ්‍යයන්ට අවකාශ දෙන්න .

ඒ ගොල්ලන්ගේ පරිපාලනය තුලින්ම සංවිධානය පවත්වා ගෙන යන්න. වැරදි කෙරුවොත් තහංචි දාන එක හරි. නමුත් වැරදි කරනවයි කියලා මුලින් පටන් ගත්තොත් කවදාවත් ඒ අය විචාරක වන්නේ නැහැ ක්‍රියා කරන්න. එසේ කිරීමට අවකාශ දෙන්නේත් නැහැ.

සංරක්‍ෂණ අධ්‍යාපනයත් ස්වභාව අධ්‍යාපනයත් වගේම කලින් කතා කෙරුව අන්දමට ඉගෙන ගන්න ගමන් උගන්වන්න ඕනා. ඒ වගේම ක්‍රියා කරන ගමන් තමයි ඒ ගොල්ලොත් ඉගෙන ගන්නේ. එම නිසා මම බලා පොරොත්තු වෙනවා එන අවුරුද්දේ සෑම පාසැලකම ඒ ස්වේච්ඡා නිල නියාමකවරු දෙදෙනා බැගින් පත් කරන්න. ඒ එක්කම සෑම පාසැලකම තියෙන ස්වභාව අධ්‍යයන සංවිධාන අපිත් එක්ක ලියාපදිංචි කරලා ඒවා තුලින් අපේ සංරක්‍ෂණ අධ්‍යාපනය කරන්න . මේ සඳහා වෙනම සැලැස්මක් දැන් හදා ගෙන යනවා. නමුත් ඒ සැලැස්මට ඔබෙත් එන අදහස් එක්කාසු කෙරුවොත් රජයේ නොවන ආයතන, රජයේ ආයතන හා ඒකාබද්ධව පොදුවේ කරන්න පුළුවන් වැඩසටහනක් හැටියට ඉදිරිපත් කරන්න අපට පුළුවන්. මොකද එහෙම ඉදිරිපත් කෙරුවම දෙන්න තියන සල්ලි හුඟක් අය දෙන්න කැමතියි. එක ආයතනයකට වඩා හුඟක් ආයතන ඒකරාශිව කරනවානම් මෙය වඩාත් සාර්ථක ව කරන්න පුළුවන්. එනිසා බය නැතිව ඔබේ අදහස් ඉදිරිපත් කරන්න.

මම දැකල තියෙන දෙයක් තමයි මගේ අත් දැකීමෙත් සතුන්, ජීවීන් පරිහරණය තුලින් බොහෝ දේ ගැන බොහෝ දෙනා ඉගෙනුමක් ලබනවා. ඒ නිසා අපි දන්නවා වැඩිමහල් අපට හුඟාක් අපහසු කාර්‍යයක් ශිෂ්‍යයන් කරනවා. මෙතැ න ඉන්න හුඟක් අය කැරපොත්තෙක් දැක්කොත් දුවනවා. සර්පයෙක් දැක්කොත් අල්ලන්නේ නැහැ. නමුත් කුඩා කල කුඩා දරුවෙක් මොකද කරන්නේ. ඕනෑම දෙයක් අත ගානවා. විසකුරු සර්පයින් වුවත් අල්ලන්න ලෑස්තියි. අපි අධ්‍යාපනයෙන් කරලා තියෙනවා අන්න ඒ ලක්‍ෂණ නැති කිරීම. ( Inquisitive investigation ) තියෙන ලක්‍ෂණ අපි සම්පූර්ණයෙන් නැති කරලා තියෙනවා. අපේ අධ්‍යාපන රටාව තුලින්. අපි ඒවායේ ප්‍රතිඵල නිසා හැම දෙයටම බියයි. බිය වෙන්න දේවල් තියෙනවා. නමුත් හැම දේටම බිය විය යුතු නැහැ. මේ වැඩ පිළිවෙල ක්‍රියාත්මක කරන්නට යන විට ඔයගො ල්ලන්ටත් ඒ ප්‍රශ්න ඇති වේවි. නමුත් ඒවායෙන් ගො.ඩ ඒමේ අවකාශ සමහර වෙලාවට අර පුහුණු මාලාවන් තුලින් ඔය ගොල්ලන්ට ලබා ගන්න පුළුවන්. බිය වෙන්න ඕන ස්ථාන බිය නොවිය යුතු ස්ථාන මොනවද කියා පෙන්වන්න පුළුවන් මේ අවස්ථාවලදී. ඒ හිත්දාම හුඟාක් දුරට ක්‍ෂේත්‍ර අධ්‍යයන සංරක්‍ෂණ අධ්‍යාපනයේ වැදගත්ම අවස්ථා වක් වෙනවා. ඒ සඳහා අවශ්‍ය අවකාශ මම කලින් කිව්වා වගේ ලබා දෙන්න කැමතියි.

පාසැල්වලට බොහෝ දේ කරන්න පුළුවන් කියලා අපි හිතනවා. ඒ නිසා මේ අඩිතා ලමේ ආරම්භය වශයෙන් කරන්න පුළුවන් සුළු සුළු දේවල් හුඟ දේටම මුදල් අවශ්‍ය බවත් අපි දන්නවා. නමුත් මුදල් අවශ්‍ය නොවන අවස්ථා ඊට වඩා විශාලයි. එවැනි දේවල් කිරීමට ප්‍රයත්න දැරීම වැදගත් . ඒ කාලය තුලදී විශේෂ පුහුණුවීම් වගේ දේවල්,එහෙම නැත්නම් ශිෂ්‍යයන්ට විශේෂ ස්වභාව චාරිකා වගේ දේවල් සැලසුම් කරලා ක්‍රියාත්මක කරන්න පුළුවන්ද කියලා බලනවා නම් අපේ මේ වැඩසටහන් මුල් අඩියරය හැටියට යොදා ගන්නට හැකි වේවියි කියලා මම විශ්වාස කරනවා. ඒ සෑම ආයතනයක්ම ඒකාබද්ධව කරන්න බලාපොරොත්තු දෙයක්. ඒ වචන වලින් මගේ මෙම කෙටි කථාව අවසන් කරනවා.

# පරිසර අධ්‍යාපනය කාර්යක්ෂමව විසරනය කිරීමේ ක්‍රම සහ ඒ සඳහා ඇති අධ්‍යාපන ආධාරක ද්‍රව්‍ය

සංරක්ෂණය හා පා තගමු සංවිධානයේ
ජයන්ත වත්තවිදානගේ මහතා

පරිසර අධ්‍යාපනය අන් බොහෝ විෂයන් අධ්‍යයනය කිරීමටත් ඉගැන්වීමටත් වඩා කරුණු කීපයකින් වෙනස් වේ. එක් ප්‍රධාන තම කරුණක් නම් බොහෝ විෂයයන් ඉගැන්වීමේදී, සිසුවා ලබන දැනුම, පරීක්ෂණයක් මගින් මැන ගත හැකි වීමත්, අවසාන පරීක්ෂණයෙන් ඉහල ලකුණු ප්‍රමාණයක් ලබා ගත හොත් එම විෂය ඉගැන්වීම පිළිබඳ සෑහීමකට පත්වීමත්ය. නමුත් පරිසරය ඉගැන්වීමේ ප්‍රධාන පරමාර්ථය සිසුවා පරිසරය පිළිබඳව දැනුම ලබා ගැනීම පමණක් නොවේ. මෙහිදී සිසුන් පරිසරය හැකිතාක් අවබෝධ කර ගත යුතුව ඇති අතර ප්‍රධාන වශයෙන්ම පරිසරය තුල කටයුතු කිරීමේදී පරිසර ප්‍රශ්න වලට මුහුණ දීමේදී ආකල්පමය වෙනසක් තුලින් ඇති වන චර්යාත්මක දියුණුවක් ඇති විය යුතුය. එසේත් නැති නම් පරිසරය කෙරෙහි වඩාත් බුද්ධිමත්ව හැසිරිය යුතුය. මේ හේතුව නිසා පරිසරය සහ සංරක්ෂණය පිළිබඳ ඉගැන්වීමේදී අන් විෂයන් ඉගැන්වීමේදී භාවිතා කරන ක්‍රම භේදයට වඩා මඳක් නම්‍ය වූ විශේෂ වූත් ක්‍රම භාවිතා කල යුතුය.

මෙහිදී අපේ වාසියට හේතු වන කරුණු දෙකක් ඇත. එනම්,

1. යමෙකු තුල ආකල්පමය වෙනසක් ඇති කල හැකි පහසුම අවදිය කුඩා අවදිය වීමත්,
2. කුඩා දරුවන් තමා ප්‍රිය කරන ගුරුවරුන් අනුගමනය, අනුකරණය සහ අගය කිරීමට බොහෝ විට යැදී පැහැදී සිටීමත්ය.

මේ අනුව මගේ පුද්ගලික හැඟීම වන්නේ කාර්යක්ෂම පරිසරය සහ සංරක්ෂණය පිළිබඳ ඉගැන්වීමට නම් ගුරුවරයා පලමුව පරිසරකාමියෙකු විය යුතු බවයි. නමින් පමණක් නොව සත්‍ය වශයෙන්ම අප පරිසරකාමීන් වන්නේ නම්, අපේ කතා බහ තුලින් හා ක්‍රියා කාර කම් තුලින් පාසැල තුලදී මෙන්ම, පාසැලෙන් පරිබාහිර කටයුතු වලදීත් පරිසරකාමීත්වය විදහමාන වේ නම්, සිසුන් අපේ ආකල්පය දෙසට බුද්ධිමත්ව නම්මා ගැනීම එතරම් අසීරු නොවන බව මගේ විශ්වාසයයි. සියලු ක්‍රමභේදයන් අතර මෙය ප්‍රධානතම පියවර ලෙසටයි මා දකින්නේ. පාසැල තුල භාවිතා කල හැකි අන් ක්‍රම සහ ආධාරක ද්‍රව්‍ය කවරේද?

1/ පුවත් පත්, ගුවන් විදුලිය, රූපවාහිනිය වැනි ජනමාධ්‍ය භාවිතා කිරීම.

මා මෙසේ කියූ වහාම ඔබේ ප්‍රතිචාරය මම දනිමි. අපේ පාසැලේ රූපවාහිනියක් නැත. ගුවන් විදුලි යන්ත්‍රයක් නැත. පුවත් පත් මිලදී ගන්නේ නැත. ඔබ පවසාවි. එය සත්‍යයකි. එසේ නමුත් බොහෝ සිසුන් තම නිවෙස් වලදී ගුවන් විදුලියට සවන් දෙති. අසල නිවසකදී හෝ රූපවාහිනිය නරඹති. මේ නිසා එම තත්ත්වය අපට උපයෝගි කරගත හැක.

(අ) පෙර දින ප්‍රවෘත්ති ප්‍රකාශයේ සඳහන් වූ කිසියම් පරිසර පුවතක් පදනම් කර ගෙන ඊට සම්බන්ධව වැදගත් කරුණු පිළිබඳ සිත යොමු කරවීම.

(ආ) අදාල වේයැයි සිතෙන හොඳ වැඩ සටහන් ඇසීම, නැරඹීම සහ කියවීම කෙරෙහි සිසුන් යොමු කරවීම.

(ඇ) පුවත් පත් වල පලවන පරිසරය සහ සංරක්ෂණය පිළිබඳ වැදගත් තොරතුරු සිසුන් කිප දෙනෙකු ලවා හෝ එකතු කරවා අන් අයටත් ප්‍රයෝජනයට ගැනීමට සැලැස්වීම.

(ඈ) පුවත් පත් වලට පරිසර තොරතුරු පිළිබඳ වාර්තා සැපයීමට උනන්දු කරවීම.

2/ බිත්ති පුවත් පත්, විවාද, තරග වැනි සිසුන් තුල උද්යෝගය ඇති වන ආකාරයේ ක්‍රියා කාරකම් ඇති කිරීම.

ඉහත කී ආකාරයේ ක්‍රියාකාරකම් තුලින් පරිසරය හා සංරක්ෂණය පිළිබඳ විවිධ කරුණු සහ තොරතුරු සෙවීම පිළිබඳ උද්යෝගයක් ඇති කල හැක. එහිදී හොඳ මඟපෙන්වන්නෙක් ලෙස කටයුතු කලොත් සිසුන් ඒ මඟ බොහෝ ඉදිරියට යනු ඇත.

3/ හැකි අවස්ථා වල ඒ ඒ ක්ෂෙත්‍රවල ප්‍රමුඛව කටයුතු කරන පුද්ගලයන් ලවා දේශන, සහ සාකච්ඡා මෙහෙයවීම.

මෙවැනි කරුණු නිසා සිසුන් තුල වැඩි විශ්වාසයක් ගොඩ නැගිය හැක.

4/ ස්වභාව විද්‍යා දිනපොත්

පාසැල අවට හෝ නිවස අසල ඍතුඝුවිකව සිදු වන කිසියම් ක්‍රියාවලියක වෙනස් වීම පිළිබඳ දින පොතක් සකස් කිරීම. ( මෙහිදී පරිසර පද්ධතියක සමතුලිත භාවය පිළිබඳවත් අප විසින්

කරනු ලබන සමහර ක්‍රියා නිසා පරිසරය දක්වන ප්‍රතිචාරයන් පිළිබඳවත් අවබෝධයක් ලබා ගත හැක.

5/ <u>බිහි වැඩ චාරිකා / අධ්‍යාපන චාරිකා.</u>

පන්ති කාමරය තුල සිසුන් ඉගෙන ගත් යම් යම් සංකල්ප පිළිබඳ ඔවුන් තුල ඇති අවබෝධය වැඩි කිරීමට බිහි වැඩ චාරිකා උපයෝගී කර ගත හැක. මේ සඳහා සිසුන් රැගෙන යා හැකි ස්ථාන ඔබේ පාසැල අසල වුවද සොයා ගත හැකි බව මඳක් කල්පනා කලොත් ඔබට වැටහේවී.

උදා: සෝදා පාලුව ගැන කියා දීමට සෝදා පාලු ඇති බිම් කඩක්. මෙහිදී වැදගත් වන්නේ එම කටයුත්ත සංවිධානාත්මකව කිරීමය.

6/ <u>සිසුන් තුල දක්නට ලැබෙන විනෝදාංශ පරිසර අධ්‍යයනය පිණිස යොදා ගැනීම.</u>

මුද්දර එකතු කිරීමට උනන්දුව ඇති සිසුවෙකු ට සත්ත්ව රූප සහිත මුද්දර එකතු කොට ඔවුන්ගේ විද්‍යාත්මක නාම, ශ්‍රී ලංකාවට ආවේණික සතුන්, වඳවීමේ තර්ජනයට මුහුණ දී සිටින සතුන් වැනි කරුණු කෙරෙහි අවධානය යොමු කරවිය හැක.

පිහාටු එකතු කිරීම විනෝදාංශය කොට ගත් සිසුන් පක්ෂීන් පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා යොමු කරවිය හැක.

7/ පරිසර සංරක්ෂණය කෙරෙහි පුරෝගාමී වූ පුද්ගලයන්ගේ චරිත කථා සහ ඒ පිළිබඳ ඉතිහාසයේ සිදු වූ වැදගත් අවස්ථා පිළිබඳ කරුණු තුලින් ඔවුන් තුල උනන්දුවක් සහ උද්යෝගයක් ජනිත කරවීම.

නිදසුනක් ලෙස රතු ඉන්දියානු ජාතික ගෝත්‍රික නායකයෙකු වූ සියැටල් එවකට අමෙරිකාවේ ආණ්ඩුකාරයාව සිටි ෆ්‍රැන්ක් ලින් පියර්ස් වෙත යවනු ලැබූ ලිපිය, සැලකිය හැක. මීට අමතරව 70 දශකය තුල ඉන්දියාවේ උත්තර ප්‍රදේශයෙහි වනාන්තර විනාශයට එරෙහිව නුගත් ගැමියන් "චිප්කෝ ආන්දොලන්" හෙවත් ගස් බදු ගැනීමේ ව්‍යාපාරය .මෙවැනි පරිසරකාමී පතාක යෝධයන්ගේ චරිත කථා අසන කුඩා මනස තුල පහලවන එඩිතර හැඟීම ඔවුන්ගේ ආකල්පමය සහ චර්යාත්මක වෙනසකට බොහෝ සෙයින් තුඩු දිය හැකි බව මගේ හැඟීමයි.

මෙවැනි ක්‍රම පරිසරය ඉගැන්වීම පිළිබඳව පංති කාමරය තුලත් ඉන් පිටතදීත් යොදා ගත හැකි වන අතර ඔබේ සුවිශේෂ තත්ඛයන්ට ගැලපෙන පරිදි එවා වෙනස් කර ගත හැක.

නමුත් මා මෙහිදී නැවතත් අවධාරනය කරන ප්‍රධානතම කරුණ නම් අප කා පරිසරය හා සංරක්ෂණය පිළිබඳ ඉගැන්වීමට නම් පලමුව අප පරිසරකාමී විය යුතු බවයි. එසේ නොමැති නම් අප මේ බේධයන් කෙතෙක් දැන සිටියත් ඒවා ක්‍රියාවට නැංවීමට අප තුල සත්‍ය වූත්, අවංක වූත් ඕනෑකමක් ඇති නොවෙනු ඇත. එසේ නමුත් අනාගත ලෝකය බාර දැත් හිමි මේ කුඩාවුන්ගේ ; දැත් පිරිසිදු කිරිමේ උපරිම ශක්‍යතාවය ඇති පිරිය ඔබ බවද සැඟවිය නොහැකි සත්‍යයකි. එහෙයින් අවසන් වශයෙන් ඒ සත් ක්‍රියාව පිනිස පිරිය හා දිරිය පතමු.

## අපේ වන ජීවී සම්පත සංරක්ෂණය කළයුත්තේ මන්ද?

උපේක්ෂා හෙට්ටිගේ මිය
වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

වර්ග කිලෝමීටර 65,610ක් පමණ වන වර්ග ප්‍රමාණයක් ඇති මේ කුඩා දිවයිනෙහි භූමි ප්‍රමාණය සමඟ සසඳන කල ශාක සහ සත්ත්ව සම්පත බෙහෙවින් පොහොසත්ය. ශාක සහ සත්ත්ව සම්පත අපට ඇති ප්‍රධානම ස්වාභාවික සම්පත්වලින් එකකි.

02. අපේ සම්පත ප්‍රධාන වශයෙන් දේශීය ශාක ( Indigenous plants ) සහ විවිධ හේතූන් නිසා මෙරටට හඳුන්වා දුන් ආගන්තුක ශාක විශේෂ (Introduced species ) වලින් සමන්විත වේ.

03. මෙරටට හඳුන්වා දුන් බොහොමයක් ශාක විශේෂ දර/දැව හෝ ආහාර පිණිස හඳුන්වා දුන් විශේෂයන් වේ. මේවායින් සමහරක් විශේෂ බෙහෙවින් ව්‍යාප්ත වී දේශානුකූලනය ( Naturalized ) තත්ත්වයට පත්වී ඇති අතර, තවත් සමහරක් වල්පැලෑටි වල තත්ත්වයට ව්‍යාප්ත වී ඇත.

04. දේශීය ශාක වශයෙන් දැනට හඳුනා ගෙන ඇති සපුෂ්පිය ශාක විශේෂ සංඛ්‍යාව 3650 කි.

මීවන සහ පරිනාමීයව මීවනවලට සමාන විශේෂ සංඛ්‍යාව - 314කි.
පාසි විශේෂ සංඛ්‍යාව - 575කි.
අන්මා ශාඛ සංඛ්‍යාව - 190කි.
ඇල්ගී ශාඛ සංඛ්‍යාව - 896කි.
දිලීර -1920කි.

මීට අමතරව තවමත් හඳුනාගෙන නොමැති ශාඛ විශේෂයං සංඛ්‍යාව ද බොහොමයකි.

05. මෙම ශාඛ විශේෂ අතරින් වඩාත් වැදගත් වන්නේ ලංකාවේ පමණක් දැකිය හැකි ආවේණික ශාඛ විශේෂයන් ය. සපුෂ්පිය ශාඛ විශේෂ අතුරින් 25 %ක්ම ආවේණික විශේෂ වේ. උද්භිද විද්‍යාත්මකව බලන කල මෙය ඉතා ඉහළ අගයක් ගනී. පරිනාමීයව පහත් ලෙස සලකන මීවන වැනි ශාඛ අතුරින් ද ඉහළ ප්‍රමාණයක් ආවේණික විශේෂයන් වේ.

06. යම්කිසි දේශගුණික කලාපයකට අනුවර්තනය වූ ස්වාභාවික වෘක්ෂලතාදිය, වනාන්තරයක් වශයෙන් හැඳින්වේ. මෙම වනාන්තර අවුරුදු දස දහස් කාලයක් තිස්සේ පරිනාමය වීමේ ප්‍රතිඵලයක් වශයෙන් අඛණ්ඩ සමතුලිතතාවයක පවතී. මෙවැනි සමතුලිත ප්‍රජා උත්කර්ෂ ප්‍රජා ( Climax vegetation ) වශයෙන් හැඳින් වේ.

මේ අනුව ලංකාවේ ප්‍රධාන වෘක්ෂලතාදි දර්ශ කිපයක් හඳුනාගත හැකිය. ඒවානම්:

I. පහත රට තෙත් කලාපීය වර්ෂා වනාන්තර – (Wet Lowland Rain Forests)

මෙම වෘක්ෂලතාදි දර්ශය තෙත් කලාපයේ මුහුදු මට්ටමේ සිට මීටර් 100ක පමණ භූමි භාගයක පැතිරී පවතී. අවුරුද්ද පුරාම වර්ෂාපතනයක් පවතී. වර්ෂාපතනය 100" – 150" පමණ වේ. මෙහි අදට ඉතිරි වී ඇති වනාන්තරවල භූමි භාගය දිවයිනේ මුළු වර්ග ප්‍රමාණයෙන් නම් 1.4 %ක් වන නමුත්, පහත රට තෙත් කලාපයට අයත් භූමි ප්‍රමාණයෙන් නම් 9 %කි.

ආවේණික ශාක අතරින් 94 %ක්ම ව්‍යාප්ත වී තිබෙන්නේ තෙත් කලාපීය වනාන්තරවලටය. එමනිසා ඉතිරි වී ඇති වනබිම් ප්‍රමාණය විනාශ වී යා නොදී රැක ගැනීම ඉතා වැදගත් වේ.

II. තෙත් කලාපීය කඳුකර වනාන්තර: (Montane Forests)

මුහුදු මට්ටමේ සිට මීටර 1000කට පමණ ඉහළින් තෙත් කලාපයේ දැකිය හැකි වෘක්ෂලතාදි දර්ශයකි. වර්ෂාපතනය අධිකය. 150"ක් පමණ වේ. ලංකාවේ මුළු භූමි ප්‍රමාණයෙන් 1.54 %ක් ද, කඳුකර කලාපයේ බිම් ප්‍රමාණයෙන් 17.8 %ක ප්‍රදේශයක තවමත් වනාන්තර ඉතිරි වී පවතී. ජල බෙත්ම (Catchment Area ) වශයෙන් වඩාත් වැදගත් වන්නේ මෙම ප්‍රදේශයන්ය. බොහොමයක් ගංගා සහ ඇල දොළ ආරම්භ වන්නේ මෙම ප්‍රදේශයෙනි.

එළවළු සහ අර්තාපල් වැවීම සඳහා බිම් එළි පෙහෙළි කිරීම, දැව/දර ලබා ගැනීමට තැලෑ කැපීම මේ ප්‍රදේශයේ වන විනාශයට ප්‍රධාන හේතු වේ.

III. වියළි කලාපීය වනාන්තර – (Dry Zone Forests)

ලංකාවේ වැඩිම බිම් ප්‍රමාණයකට පැතිරී තිබෙන්නේ, මෙම වෘක්ෂලතාදි

දක්වයි. වර්ෂාපතනය 50" - 75" කි. වර්ෂාව නොලැබෙන පැහැදිලි වියළි කාලයක් ඇත. දිවයිනේ මුළු බිම් ප්‍රමාණයෙන් 21.9 %ක් ද, එනම් වියළි කලාපයට අයත් බිම් ප්‍රමාණයෙන් නම් 30.3 %ක ප්‍රමාණයක තවමත් වනාන්තර ඉතිරි වී ඇත. මෙම වනාන්තරවල තිබෙන ආවේණික විශේෂ සංඛ්‍යාව බෙහෙවින් අඩුය. එය ලංකාවේ වැවෙන ආවේණික ශාඛ සංඛ්‍යාවෙන් 6%ක් පමණ වේ.

හේන් ගොවිතැන්, කෘෂිකාර්මික කටයුතු සහ තඩිනම් සංවර්ධන කටයුතු සඳහා කැලෑ එළි කිරීම නිසා දැනට බොහොමයක් ප්‍රදේශවල ඉතිරි වී ඇත්තේ ද්විතියික ශාඛ ප්‍රජාවකි.

IV. <u>අන්තර් කලාපීය වනාන්තර</u> - (Intermediate Zone Forests)

ලංකාවේ මුළු බිම් ප්‍රමාණයෙන් 1 %කටත් වඩා අඩු ප්‍රමාණයක මෙම වනාන්තර ඉතිරි වී ඇත.

V. <u>සවානා වනාන්තර</u> - (Tropical Savannah Forests)

තෘණ බිම්වල අරළු, බුළු, නෙල්ලි වැනි ඖෂධීය වටිනාකමක් ඇති ශාක විසිරී ඇත.

VI. <u>කටු පඳුරු සහ ලඳු කැලෑ</u> - (Tropical Thorn Forests)

ශුෂ්ක ප්‍රදේශවල දැකිය හැක. වර්ෂාපතනය 25"කටත් වඩා අඩු බැවින් බොහොමයක් ශාඛ විශේෂ වියළි දේශගුණයට අනුවර්තන පෙන්වයි.

VII. <u>තණ භූමි</u> - (Grasslands)

දමන, විල්లු, තැතිල්ල, පතන සහ තලාව තණ බිම්. දමන සහ විල්ලු තණ බිම් වියළි කලාපයේ ද, තැතිල්ල, තලාව සහ පතන තණ බිම් තෙත් කලාපයේ ද දැකිය හැක.

VIII. <u>වෙරළබඩ ශාඛ</u> - (Coastal Vegetation)

වෙරළබඩ කැලෑ, මුහුදු තණ බිම්.

1X. කඩොලාන ශාඛ ප්‍රජාව. (Mangrove Forests)

X. මඩවගුරු සහ මිරිදිය ජලජ ශාඛ ප්‍රජාව. (Marsh & Freshwater Plants)

<u>වනාන්තරවලින් අපට ඇති වැදගත්කම</u>

1) <u>ආරක්ෂක කෘත්‍යයන් ඉටු කිරීම</u>

ජල බෙන්ම වශයෙන් ක්‍රියා කිරීම - වනාන්තර ප්‍රධාන ගංගා සහ අනෙකුත් ඇල දොළ ජලධාරා පෝෂණය කරනු ලබයි. වර්ෂා ජලය, ශාඛ පොළව මතුපිට ඇති කාබනික ද්‍රව්‍ය ( litter) ස්ථරය සහ පස් මඟින් හොඳින් උරා ගනී. මෙම ජලය සෙමෙන් මුදවා හරිනු ලැබේ. මෙසේ පටන් ගන්නා කුඩා දිය පහර ගංගා සහ ඇල දොළවල් පෝෂණය කරයි. මේ නිසා වියළි කාලයේදී පවා ගංගා ඇල දොළවලට ජලය ලැබේ.

පස් ආරක්ෂා කිරීම - පොළව මතුපිට ඇති තුරු ආවරණය නිසා වර්ෂා ජලය පොළව මතුපිට වැටෙන වේගය මඳ වී බිංදු වශයෙන් පහළට බේරේ. මේ නිසා පස් සෝදා යාමත් සිදුවන්නේ නැත. මීට අමතරව ශාඛ මූල පද්ධති මඟින් පස් අංශු හොඳින් බැඳ තබා ගනී.

2) ආර්ථික වටිනාකම -

වනාන්තර මිනිසාට අ) ආහාර සපයයි.

ආ) දැව සපයයි.

ඇ) දර සපයයි.

ඉ ) සුළු වාණිජ ද්‍රව්‍ය වශයෙන් සැලකෙන වේවැල්, බට, කිතුල් පැණි, හකුරු, බෙහෙත් ද්‍රව්‍ය සහ දැව නොවන බොහෝ ද්‍රව්‍ය සපයනු ලබයි.

3) ජාන කිට්ටුවක් ( Gene Pool ) වශයෙන් ක්‍රියා කිරීම සහ ජාන විවිධාංගතය රැක ගැනීම.

4) සෞන්දර්යාත්මක අගය, මානසික සුවය සහ සංස්කෘතික වටිනාකම -

5) අධ්‍යාපනික සහ විද්‍යාත්මක වැදගත්කම -

අපේ සත්ත්ව සම්පත පැහැදිලි කිරීමේ පහසුව තකා පෘෂ්ඨ වංශී සහ අපෘෂ්ඨ වංශී වශයෙන් ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදා සාකච්ඡා කළ හැකිය.

අපෘෂ්ඨ වංශීන් අතුරින් අපට වඩා වැදගත් වන්නේ කෘමීන්, ක්‍රස්ටේසියාවන් සහ ඇනලිඩාවන්ය.

ක්‍රස්ටේසියාවන් අතුරින් මිරිදිය සහ තරදිය කකුළුවන්, ඉස්සන් සහ පොකිරිස්සන් ආර්ථික වශයෙන් ඉතා වැදගත් වේ. මොවුන් ලංකාවට විශාල විදේශ විනිමයක් ද ලබා දේ. නමුත් වැඩිපුර පරිභෝජනය, පාලනයක් රහිතව අක්‍රමවත් ලෙසින් අස්වැන්න නෙළා ගැනීම වැනි කරුණු නිසා මේ සම්පත අපට නැති වී යා හැකිය. මොවුන් වැඩිපුර වසන්නේ කලපු, මෝය වැනි කිවුල් ජලය සහිත ස්ථානවලය.

කෘමීන් – කෘමීන් වඩා වැදගත් වන්නේ කෘෂිකාර්මික භෝග සහ වෙනත් ස්වාභාවික වෘක්ෂලතාදීන්ගේ පරාගණය සඳහායි. නූතන කෘෂි රසායන ද්‍රව්‍ය, පළිබෝධ නාශක සහ කෘමිනාශක නිසා මෙම ජීවීන් විනාශවීමේ තර්ජනයකට මුහුණ පා සිටිති. සමනලයන්, සලබයන් වැනි අලංකාර කෘමි විශේෂ මගින් අපට සෞන්දර්යාත්මක අගයක් සහ මානසික සුවයක් ලැබේ. ලංකාවට පමණක් විශේෂ වූ ආවේණික කෘමීන් විශාල සංඛ්‍යාවක් සිටිති.

පෘෂ්ඨ වංශීන් සැලකූවිට ගොඩබිම වසන, වාර්තා වී ඇති පෘෂ්ඨ වංශීන් විශේෂ සංඛ්‍යාව 625කි. සාකච්ඡා කිරීමේ පහසුව පිණිස පෘෂ්ඨ වංශීන්, මත්ස්‍ය උභය ජීවීන්, උරග, කුරුළු සහ ක්ෂීරපායී වශයෙන් වර්ග කළ හැක.

මත්ස්‍යයන් සැලකූවිට සර්ම කලාපීය අනෙක් රටවලට සාපේක්ෂව ලංකාවේ සිටින දේශීය මත්ස්‍ය විශේෂ සංඛ්‍යාව බෙහෙවින් අඩුය. ලංකාවෙන් දේශීය විශේෂ 54ක් පමණ හඳුනාගෙන තිබේ.

ආර්ථික වශයෙන් සලකන තල මසුන් ඉතාම වටිනා සම්පතකි. ලාභදායීම ප්‍රෝටීන් සැපයුම වන්නේ මත්ස්‍යයන්ය. එබැවින් ලංකාව වැනි දියුණුවන රටකට, මත්ස්‍ය සම්පත ඉතාම වැදගත් වේ. නමුත් ලංකාවේ ධීවර කර්මාන්තය වැඩිපුර රඳා පවතින්නේ කරදිය මසුන් මතය. ලංකාව අවට ඇති නොගැඹුරු මුහුදු වෙරළට ආහාර සඳහා, බිත්තර දැමීම සඳහා සහ යනු වෙනස්වීම් නිසා විශාල වශයෙන් මත්ස්‍ය ගහණ සංක්‍රමණය වේ.

කොරල් පර අසළ වෙසෙන අලංකාර මසුන්, සුරත්ල් මසුන් ලෙස පිටරටට විශාල වශයෙන් අපනයනය කෙරේ. මෙය, මේ සම්පත ඉක්මණින්ම නැතිවී යාමට හේතුවන්නනි. මෙසේ ඇගෙන යන මසුන්ගෙන් 50 %කටත් වැඩි ප්‍රමාණයක්, ඔවුන්ගේ අවශ්‍ය පරිසර තත්ත්වයන් නොලැබීම නිසා අතරමගදීම මිය යති. පාලනයක් රහිතව කෙරෙන මෙවැනි ක්‍රියා නිසා මෑත යුගයේදීම මේ සම්පත අපගෙන් අහිමිවීමට ඉඩ තිබේ.

උභය ජීවීන් -

ලංකාවෙන් වාර්තා වී ඇති විශේෂ 38 අතුරින් විශේෂයන් 16ක්ම මෙරටට ආවේණික විශේෂ වේ.

Nannophrys ගණය ලංකාවට ආවේණිකය. විශේෂ තුනක් ලංකාවෙන් වාර්තා වී ඇත. මෙම විශේෂය වෙසෙන්නේ කඳුකර පළාත්වල දියපාරවල් අසලය.

Philatus පඳුරු ගෙම්බා. දුර්ලභ ගෙඕ විශේෂයකි. කෘමි භක්ෂක මෙවැනි ජීවීන් ගොවියාට හිතමිතුරෙකි. කෘෂිකාර්මික භෝගවලට හානි කරන සමහර කෘමි විශේෂ මෙම ගෙඕ සහ මැඩියන් විසින් ආහාරයට ගනු ලැබේ. එමනිසා පරිසරය සමතුලිතව තබා ගැනීමට ඉතා වැදගත් වේ.

උරගයන් -

ලංකාවෙන් වාර්තා වී ඇති උරග විශේෂ 158 අතුරින් විශේෂ 75ක්ම ලංකාවට ආවේණික විශේෂ වේ.

කිඹුල් විශේෂ 2ක් හඳුනාගෙන ඇත. එක් විශේෂයක් මෝය සහ කලපු ආශ්‍රිතව ද, අනෙක් විශේෂය ප්‍රධාන ජලාශ ආශ්‍රිතව ද වෙසේ.

කැස්බෑ විශේෂ - ලෝකයේ වෙසෙන කැස්බෑ විශේෂ අතුරින් අඩකටත් වඩා වැඩිපුර විශේෂ සංඛ්‍යාවක් මුහුදු ලංකාවේ මුහුදු වෙරළට බිත්තර දැමීම සඳහා පැමිණෙති. ලංකාවේ මුහුදු වෙරළට පැමිණෙන කැස්බෑ විශේෂ පහකි. සියළුම කැස්බෑ විශේෂ වඳ වී යාමේ තර්ජනයකට මුහුණ පා සිටී. ඉතාම සංවේදී මෙම සතුන්, මසුන් ඇල්ලීමේ දී භාවිතා කරන දැල් ආදිය

නිසා සහ බිත්තර ආහාරයට ගැනීම නිසා ජීවීන්ගෙන් තුරන් වී යන කාලය ඉතාම ආසන්න වී ඇති බව පැහැදිලිය.

ඉබ්බන් විශේෂ 3ක් ලංකාවේ වෙසෙති. ඔවුන් නම් තරු ඉබ්බා, කිරි ඉබ්බා සහ ගල් ඉබ්බාය. මින් සමහරක් විශේෂ ගොඩබිම ද, අනෙක් විශේෂ මිරිදියෙහි ද වෙසෙති. ආහාර පිණිස මේ සතුන් මරනු ලැබේ.

ලංකාවේ වෙසෙන කටුස්සු, හූනන් සහ හිකනලා විශේෂ, සත්ත්ව විද්‍යාත්මකව ඉතා වැදගත් වේ. ඔවුන් අතරින් ආවේණික විශේෂ සංඛ්‍යාව ඉහළ අගයක් ගනී. සමහරක් විශේෂ ඉතා දුර්ලභය. ඔවුන් ශාඛ කොටස් සහ කෘමි භක්ෂණය සිදු කරති.

Ceratophora stoddarti ආවේණික හූනන් විශේෂයකි. නකල්ස් කඳු ප්‍රදේශයෙන් වාර්තා වී ඇත.

තුඹර ගොයා - කසළ සහ මළ ද්‍රව්‍ය මත යැපෙන මෙම උරග විශේෂය ශාඛ සහ සත්ත්ව ආරක්ෂිත පනත යටතේ ආරක්ෂිත සත්ත්ව විශේෂයකි.

සර්ප විශේෂවලින් සමහරක් විෂ සහිතය. බොහෙමයක් ආවේණික සර්ප විශේෂ කසළ සහ දිරාපත්වන ද්‍රව්‍ය අතර ජීවත් වෙමින් ඒවා ආහාරයට ගනී. නූතන කෘෂිකාර්මික උපක්‍රම මගින් මොවුන් බොමොහයක් විනාශ වී ගොස් ඇත.

තුරුල්ලන් -

විශේෂ 384 ක් වාර්තා වී ඇත. මෙයින් විශේෂ 20ක් ලංකාවට ආවේණිකය. ශීත ඍතුවේ දී මෙරටට සංක්‍රමණය වන මොවුන් අගෝස්තු මාසයේ දී ලංකාවට පැමිණ, අප්‍රේල්, මැයි මාස දක්වා ලංකාවේ වෙසෙති.

Black necked stork - වඳ වී යාමේ තර්ජනයකට මුහුණ පා සිටින දුර්ලභ ගණයේ තුරුළු විශේෂයකි.

වලි කුකුළා – ලංකාවට ආවේණික අලංකාර කුරුල්ලෙකි.
මසට මැරීම සහ කැලෑ කැපීම නිසා උන්ගේ
වාසස්ථාන නැති වී වඳ වී යාමේ තර්ජනයට
මුහුණ පා සිටින කුරුළු විශේෂයකි.

මොනරා – අලංකාර පක්ෂි විශේෂයකි.

Blue Magpie – ආවේණික දුර්ලභ පක්ෂි විශේෂයකි.

කුරුල්ලන්ගෙන් අපට ලැබෙන සෞන්දර්යාත්මක අගය ඉතා ඉහළය.

<u>ක්ෂීරපායි</u> –

විශේෂ 86ක් ලංකාවෙන් වාර්තා වී ඇත. එයින් විශේෂ 10ක්ම ආවේණික වේ.

කුඩා ක්ෂීරපායින් – මීයන්.

ප්‍රයිමේට්ාවන් – වඳුරන් සහ රිලවුන්. පහත රට තෙත් කලාපයේ වෙසෙන Purple faced leaf Monkey ලංකාවට ආවේණිකය.

තිත්මුවන් සහ මී හරකුන් – ලංකාවේ වැඩිපුරම වෙසෙන මුව විශේෂය.

ගෝනුන්

වලසුන්

දිවියන් – ලංකා වේ උප විශේෂයන් දැකිය හැක.

බළල් විශේෂ

අපේ සංස්කෘතික උරුමයන් සහ දායාදයන් ලෙස සැලකෙන අලි ඇතුන් – මොවුන් වඳ වී යාමේ තර්ජනයකට මුහුණ පා සිටිති. මෙයට ප්‍රධාන හේතුව ඔවුන් වෙසෙන වාසස්ථාන නැතිවී යාමයි. දැව සහ දර ලබාගැනීම සඳහා කැලෑ කැපීම, සහ සංවර්ධනය සහ කෘෂිකාර්මික කටයුතු සඳහා කැලෑ එළිකිරීම නිසා මොවුන්ගේ වාසස්ථාන නැති වී ගොස් ඇත.

අපේ පැවැත්ම මෙන්ම අනාගත පරපුරේ සුබසිද්ධිය සඳහා වන ජීවී සම්පත සුරකිමු.

පාසල් විෂයමාලාවේ පරිසර / සංරක්ෂණ **ANNEX G**

## අධ්‍යාපනයට අදාළ අපේක්ෂා

## හා

## අරමුණු

(ජී. එච්. ශෝභමදාස මහතා , ව්‍යාපෘති නිලධාරි ජාතික අධ්‍යාපන ආයතනය)

මූලාසනයෙන් අවසරයි, ශ්‍රී ලංකා ස්වාභාවික සම්පත් බලශක්ති හා විද්‍යා අධිකාරියේ නිලධාරි මහත්මීයනි, මහත්වරුනි, "සංරක්ෂණය සඳහා පා නගමු" සංවිධානයේ පරිසරකාමී සාමාජික සාමාජිකාවනි , මෙහි රැස්ව සිටින ඌව ප්‍රදේශයේ පාසල්වල සේවය කරන ගුරු මහත්මීයනි, ගුරු මහත්වරුනි, ඔබ සැමගෙන් අවසරයි.

මේ අවස්ථාවේ මා වෙත පැවරී ඇත්තේ පාසල් විෂයමාලාවේ පරිසර/ සංරක්ෂණ අධ්‍යාපනයට අදාළ අපේක්ෂා හා අරමුණු පැහැදිලි කිරීමේ කාර්යයයි.

පරිසරය සුරැකීම, පරිසර සංරක්ෂණය වැනි මාතෘකා අද වැඩි දෙනෙකුගේ කතා බහට ලක් වී ඇති බව අප සැම දන්නා කරුණක්. මෙම මාතෘකා තේමා කර ගත් ක්‍රියාකාරී වැඩ සටහන් සංවිධානය කරන ආයතන පිළිබඳවද නිතර ඔබ අසා ඇති . ග්‍රාමීය මට්ටමෙන්, නාගරික මට්ටමෙන් පළාත් මට්ටමෙන් මෙන්ම රාජ්‍ය මට්ටමෙන්ද අන්තර් ජාතික මට්ටමෙන් ද පවත්වා ගෙන යන මේ සංවිධාන පරිසරය කෙරෙහි මෙතරම් විමසිලිමත්ව ඇත්තේ කවර හෙයින්ද? අපි මේ ගැන සොයා බලමු.

පරිසරයේම සංඝටකයක් සේ සැලකෙන මිනිසා කෙරෙහි පරිසරයෙන් එල්ල වන තර්ජන රැසක් ගැන නිතර අසන්න ලැබෙනවා. නියඟ, ජලගැලීම්, දුගඳ හමන කසල ගොඩවල් නිසා අප දැඩි පීඩාවන්ට පත්ව සිටිනවා. තවත් පැත්තකින් බලන කල පස නිසරු වීම, කාන්තාරකරණය, සත්ව හා ශාක විශේෂවල සීඝ්‍ර වඳවීම ගැන තොරතුරු අසන්නට ලැබෙනවා. අපගේ දැඩි අවධානයට තවමත් හසු නොවූ තවත් අර්බුද කෙරෙහිද විද්‍යාඥයන් විමසිල්ලෙන් පසු වෙනවා. සාගර ජල මට්ටම ඉහළ යාම, අපේ වායුගෝලයේ වූ ඕසෝන් ස්ථරය තුනී වීම විද්‍යාඥයන්ගේ දැඩි අවධානයට යොමු වූ තවත් පරිසර ගැටලු දෙකක්.

පුද්ගල මට්ටමෙන් වගේම සාමූහික මට්ටමෙන්ද පරිසරයට එල්ලවී ඇති තර්ජන හමුවේ මිනිසා කෙතරම් අසරණව සිටිනවාද කියනවා නම් ඔහු අද නොයෙක් විදියේ කායික පීඩාවලට වගේම මානසික පීඩාවලටද ගොදුරුව සිටිනවා. අකල් මරණ විෂ ශරීරගත වීම්, ශ්වසන රෝග ඇතුළු වෙනත් ශාරීරික රෝග මිනිසාට මුහුණ පෑමට සිදු වී තිබෙන කායික පීඩා විදියට හඳුන්වන්න

පුළුවන්. ඒ වගේම බියෙන් ජීවත් වීම සැකයෙන් යුතුව කල් යැවීම අපේක්ෂා භංගත්වය මිනිසා මුහුණ පා සිටින මානසික පීඩා විදියට හඳුන්වන්න පුළුවන්. මේ මානසික පීඩා කෙතරම් තදින් මිනිසාට බලපා තියෙනවා ද කියනවා නම් ඇතැම් අවස්ථාවලදී මානසික පීඩා හේතු කොට ගෙන මිනිසා උමතු වෙනවා. එසේත් නැතිනම් ආක්‍රමණශීලී බවක් නිරූපනය වෙනවා. නූතන මිනිසා මේ උවදුරුවලට ගොදුරුව ඇත්තේ කුමක් නිසාදැයි මොහොතක් සිතා බලන්න. එවැන්නක් සිදු වී ඇත්තේ අන් කිසිවක් නිසා නොව නූතන මිනිසාත් පරිසරයත් අතර සබැඳියාව බිඳ වැටී ඇති නිසාය.

පරිසරය හා මිනිසා අතර සබැඳියාව බිඳ වැටීමට හේතු මොනවාද? මේ පිළිබඳව විමසා බැලීමේදී රෝම සමුළුවට අයත් විද්‍යාඥයන් කළ එක් ගවේෂනයක් මෙහිදී සිහිපත් කරන්න පුළුවන්. ලෝකයේ සියලු ජාතීන්ට අයත් මිනිසුන්ට මුහුණ පෑමට සිදු වී ඇති ගැටලු විශ්ලේෂණය කිරීම ඔවුන්ගේ මෙම අධ්‍යයනයේ අරමුණ වුනා. එම අධ්‍යයනයට අනුව පෙනී යන්නේ ලෝකවාසී ජනතාවගෙන් වැඩි දෙනෙකුගේ දැඩි අවධානය ළඟ සතිය තුළදී හෝ ළඟ අවුරුදු කිහිපය තුළ දී හෝ තම පවුල සඳහා හෝ තම ව්‍යාපාරයට අදාළ කටයුතු කෙරෙහි හෝ යොමු වී පවතින බවයි. අනාගත ලෝකය සඳහා හෝ දරුවන්ගේ ලෝකයට අදාළ කටයුතු පිළිබඳව සොයා බැලීමට හෝ ඒ ගැන ක්‍රියාකාරී වීමට හෝ යොමු වන මිනිසුන් වේ නම් ඒ අතළොස්සකි. මෙම ගවේෂනය සමස්ථයක් වශයෙන් ගත් කළ පැහැදිලිව පෙනෙන්නේ නූතන මිනිසා ආත්මාර්ථකාමී සත්වයකු සේ ක්‍රියා කරන බවකි. නූතන මිනිසා ඉතා දැඩි සේ එල්බ සිටින මේ ආත්මාර්ථකාමී ගුණය හේතු කොට ගෙන දීර්ඝ කාලීන ගැටලු රාශියකට නූතන ලෝකය මුහුණ පා සිටින බව කියන්න පුළුවන්. ඒ ගැටලු ඇති වීමට සාධක දෙකක් හේතු වී තියෙන බව මෙම විද්‍යාඥයන් කණ්ඩායම පෙන්වා දෙනවා. ඒ සාධකවලින් එකක් නම් පරිසරය කෙලෙසීමයි. අනිත් සාධකය නම් බලය සඳහා කෙරෙන අරගලයක් සේ සැලකිය හැකි යුද අවි තරඟයයි.

නූතන ලෝකය මුහුණ පා සිටින මේ අභියෝගවලින් අත්මිදීමට ලබා ගැනීමට නම් මිනිසා ගේ හැසිරීම් රටාව නිසැකයෙන්ම වෙනස් විය යුතුය. එමෙන්ම ඔහු පරිසරය කෙරෙහි දැනට දක්වන ආකල්ප වහා වෙනස් කරමින් පරිසරකාමියකු සේ දැඩි වගකීමකින් යුතුව හැසිරිය යුතුය. අවසානයේදී දරුවන්ගේ ලෝකය වඩාත් යහපත් පරිසරයක් සේ පවත්වා ගැනීමට උරදීම අප හැමගේ අපේක්ෂාව හා වගකීම විය යුතුය.

මේ සියලු අපේක්‍ෂා මුදුන් පමුණුවා ගැනීම සම්බන්ධයෙන් වැඩි වගකීමක් පැවරෙන සංවිධානයක් විදියට පාසල හඳුන්වන්න පුළුවන්. පාසල් අධ්‍යාපනය තුලින් අප අපේක්‍ෂා කළයුත්තේ පරිසරයට අදාළව වගකීමෙන් යුතු චර්යාවක් දක්වන පුරවැසියන් බවට පත්වීම සඳහා සිසුන් දිරිගැන්වීම හා උනන්දු කරවීමයි. මේ අපේක්‍ෂාව මුදුන් පමුණුවා ගැනීම සඳහා පහත සඳහන් අරමුණු ඉලක්ක කර ගනිමින් අධ්‍යාපනය ලබා දීම වැදගත්වේ.

1. සමස්ථ පරිසරය හා සබැඳි ප්‍රශ්න පිළිබඳව සංවේදිතාවක් හා සතිමත් බවක් ඇති කිරීම.
2. පරිසරය සබැඳි ප්‍රශ්න ඒවාට අදාළව මානව වර්ගයාගේ භූමිකාව හා වගකීම පිළිබඳ දැනුම හා අවබෝධය දියුණු කිරීම.
3. පරිසරය සුරැකීමට අදාළ ප්‍රශ්න විසඳීමට අවශ්‍ය කුසලතා ප්‍රගුණ කිරීම.
4. පරිසරය සබැඳි ප්‍රශ්න විසඳීමට පෙළඹීම හා ඒවාට ක්‍රියාකාරීව සහභාගිවීම.
5. පරිසරයට අදාළ වන වැඩ පිළිවෙල යෝග්‍යතාව ඇගැයීමට හැකි වීම (පරිසර විද්‍යාත්මක, දේශපාලනමය ආර්ථික සමාජීය සංස්කෘතික හා සෞන්දර්යාත්මක සාධක අනුව)

මෙම අරමුණු ඉටු කිරීමට හෝ ඉටුකර ගැනීමට හෝ සුදුසු පසුබිමක් දැනට පවත්නා පාසල් විෂයමාලාවේ තිබේද? යථෝක්ත අරමුණු ඉටු කර ගැනීමට ප්‍රමාණවත් පසුබිමක් පාසල් විෂයමාලාවේ ඇති බව ඒ ඒ විෂයමාලා පුළුල් ලෙස විමසා බලන කල පෙනී යනවා. ප්‍රාථමික පාසල් විෂයමාලාවට අයත් විෂයන් අතරෙන් එකක් වනුයේ පරිසර අධ්‍යයනයයි. පරිසරයෙන් ඉගෙනීම කේන්ද්‍ර කර ගනිමින් පරිසර අධ්‍යයන විෂය මාලාව ගොඩ නගා තිබෙනවා. විද්‍යාව සමාජ අධ්‍යයනය , සෞඛ්‍යය අපේ සංස්කෘතික වටපිටාව, සෞඛ්‍යය යන විෂය කොටස් සමෝධානික මුහුණුවරකින් එහි අන්තර්ගත වී තියෙනවා. මේ නිසා ප්‍රාථමික පාසල් අධ්‍යාපනයේ පාරිසරික අධ්‍යාපනය සම්බන්ධයෙන් දක්නට ලැබෙන්නේ අන්තර් ශික්ෂණ ප්‍රවේශයක්. වසර 6 සිට වසර 11 තෙක් පන්තිවලදී පාරිසරික අධ්‍යාපන අරමුණු ඉටු කර ගැනීමට ඉවහල් වන විෂයයන් කිහිපයක් ම තිබෙනවා. විද්‍යාව, සමාජ අධ්‍යයනය මව් බස, ගණිතය, සෞන්දර්ය අධ්‍යාපනය එම විෂයයන් විදියට හඳුන්වන්න පුළුවන්. මෙම විෂයන්ගේ විෂය සන්ධාරය විමසා බැලීමේදී පාරිසරික අධ්‍යාපනයට අදාළ විෂය කරුණු රසක් එහි අන්තර්ගත වී ඇති බව පෙනී යනවා. මේ අනුව බලන කළ පැහැදිලි

වන්නේ ද්විතීය මට්ටමේ දී පාරිසරික අධ්‍යාපනය සම්බන්ධයෙන් ගෙන ඇත්තේ බහු ශික්ෂණ ප්‍රවේශයක් බවයි. පාසල් විෂයමාලාව තුළ පාරිසරික අධ්‍යාපනයට අදාළ විෂය කොටස් ගැබ් වූ පමණින් පාරිසරික අධ්‍යාපන අරමුණු මුදුන් පමුණුවා ගන්න හැකි වෙන්නේ නැහැ. ඒ ඒ විෂය ආශ්‍රිතව ශිෂ්‍යයා ලබන අත්දැකීම් අරමුණුවලට ගැලපෙන අයුරින් ඉගැන්වීමද මෙහිදී වැදගත් වන බව කිවයුතුයි. වෙනත් වචනවලින් කිවහොත් ගුරුවරයා භාවිතයට ගන්නා ඉගැන්වීම් ක්‍රමද අපේක්ෂිත අරමුණු හා ගැළපිය යුතු වේ.

පාරිසරික අධ්‍යාපනයට අදාළ පාඩමක් ඉගැන්වීමේ යෙදෙන අවස්ථාවක ගුරුවරුන් වන අප විසින් සිසුන්ගෙන් අපේක්ෂා කරන චර්යා රාශියක් තිබෙනවා. උනන්දුවෙන් ශ්‍රවනය කිරීම, අදාළ කරුණු රැස්කිරීම , කුසලතා ප්‍රගුණ කිරීම, ප්‍රශ්න විසඳීම හා ඒවාට සහභාගිවීම, තීරණ ගැනීම............ මෙබඳු චර්යාවන් හි සිසුන් නිරත වේයයි අප අපේක්ෂා කරන නමුත් සැබවින්ම පන්ති කාමරයේ දක්නට ලැබෙන්නේ මීට හාත්පසින්ම වෙනස් වූ චර්යාවන්ය. නිසොල්මනේ සවන් දීම, සටහන් ලිවීම, පිළිතුරු දීම, පිළිතුරු ලිවීම, වැනි චර්යාවන් බොහෝ විට පන්ති කාමරය තුළින් අපට දැකිය හැකි ශිෂ්‍ය චර්යාවන් වේ. විභාගය පමණක් ඉලක්ක කර ගනිමින් දේශන ක්‍රමයෙන් සිදු වන ඉගැන්වීම් කාර්‍යයන්හිදී එබඳු චර්යාවන් සිසුන්ගෙන් විද්‍යමාන වන බව අපි දනිමු. මෙබඳු ඉගැන්වීම් ක්‍රමවලින් විෂය කරුණු මතක තබා ගැනීමටත්, ප්‍රශ්නවලට පිළිතුරු ලිවීම පුරුවීමටත්, විභාගවලින් හොඳ ප්‍රතිඵල ලබා ගැනීමටත් සිසුන් පෙළමේ. ඉගැන්වීමේ කාර්යයේ අවසාන ඵලය විභාගය සඳහා පමණක්ම විය යුතුද? දැනුම ලබා දීමට පමණක් සීමා නොවී සමාජයේ හා පරිසරයේ ප්‍රගමනයට උචිත කුසලතා හා ආකල්පද සිසුන් තුළ වර්ධනය කරවීම ගුරුවරයාගේ වගකීම විය යුතුය.

මානව වර්ගයා වෙනුවෙන් යථෝක්ත වගකීම ඉටු කිරීම අපගේ අපේක්ෂාව නම් පාසල තුළින් අප බිහි කළ යුත්තේ දැනුම පමණක් ඇති පුරවැසියකු නොව ක්‍රියාකාරී පුරවැසියකුය. දැනුම පමණක් ඇති පුද්ගලයා ක්‍රියා කළ නොහැකි පුද්ගලයෙකි. දැනුම හා කුසලතා පමණක් ඇති පුද්ගලයා ක්‍රියා කළ හැකි පුද්ගලයකු මිස ක්‍රියාකාරී පුද්ගලයකු නොවේ. යම් කෙනෙකු ක්‍රියාකාරී පුද්ගලයකු වන්නේ දැනුම හා කුසලතා පමණක් නොව පරිසරයේ හා සමාජයේ ප්‍රගමනය කෙරෙහි උචිත ආකල්පද ඇති විටය. ආකල්ප වර්ධනය කිරීමට උචිත පසුබිමක් ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රියාවලිය තුළින් ගොඩනැගිය හැක්කේ කෙසේද? ඒ සඳහා විෂය කරුණු

මුල්කර ගෙන ඉගැන්වීමෙන් බැහැරවී ප්‍රශ්න හා ගැටලු කේන්ද්‍ර කර ගත් ඉගැන්වීම් ක්‍රම භාවිතය කෙරෙහි අපගේ අවධානය යොමු විය යුතුවේ. කරුණු කියා දීම වෙනුවට කරුණු සොයා ගැනීමට සිසුනට උදවු කළ යුතුය. අවවාද වෙනුවට ඔවුනට තීරණ ගැනීමට පසුබිම ගොඩ නැගිය යුතුය. මෙම අපේක්‍ෂා කරා සම්පවීමේදී සිසුන් තනි තනිව මෙන්ම කණ්ඩායම් වශයෙන්ද ක්‍රියා කළ හැකි වන අයුරින් ඉගෙනුම් ක්‍රියාවලිය සැලසුම් කළ යුතුවේ. ඒ සඳහා ඔබේ ඉගැන්වීමේ ක්‍රියාවලියට ඇතුලත් කළ හැකි ශිල්ප ක්‍රම විදියට පැවරුම් සාකච්ඡා ව්‍යාපෘති චරිතාංග රංගන ප්‍රචාරක ව්‍යාපාර ආදිය හඳුන්වන්න පුළුවන්.

පාරිසරික අධ්‍යාපන වැඩ සටහනක් සාර්ථක කර ගැනීමේදී අපගේ අවධානය යොමු විය යුතු තවත් පැත්තක් විදියට ඇගැයීමද හඳුන්වන්න වෙනවා. දැනුම පමණක් කේන්ද්‍ර කර ගනිමින් ලකුණු ලබා දෙන ඇගැයීම් ක්‍රමවලින් බැහැරවී සිසුන්ගේ කුසලතා ආකල්පද පිළිගැනීමට ලක්වෙන ඇගයීම් ක්‍රම කෙරෙහි අපට මෙහිදී සොයා බලන්න සිදු වෙනවා. ඇගැයීම ශිෂ්‍යයාට මෙන්ම ගුරුවරයාටද තම කා ර්යවල සාර්ථකත්වය සොයා බලන්න ප්‍රයෝජනවත් වෙන මිනුම් දණ්ඩක් විදියට හඳුන්වන්න පුළුවන්. වෙනත් වචන වලින් කියනවා නම් ශිෂ්‍යයාට සිය ඉගෙනීමේත් ගුරුවරයාට සිය ඉගැන්වීමේත් සාර්ථකත්වය මැන ගැනීමට ඉවහල් වන්නේ ඇගැයීමයි. පාරිසරික අධ්‍යාපන වැ ඩ සටහනකට යොදා ගන්නා ඇගැයීම් ක්‍රම සංවිධානය කළ යුත්තේ පාරිසරික අධ්‍යාපනයෙන් ශිෂ්‍යයා අසමත් බව හෝ සමත් බව හෝ තීරණය කිරීමේ අරමුණෙන් නොවේ. පාරිසරික අධ්‍යාපනයෙන් ශිෂ්‍යයා අසමත් වීම වනාහි සමස්ථ මානව වර්ගයාගේ ජීවිත සටනේ පරාජයකි. ජීවිත සටනේ ජය කනුව කරා සමීප වීම සඳහාත් දරුවන්ගේ ලෝකය වඩාත් යහපත් තත්ත්වයකට ගෙන ඒමටත් ඔබ සතුව ඇති යුතුකම මැනවින් ඉටු කිරීමට අවශ්‍ය දිරිය ඔබට ලැබේවා යි පතමින් මා නවතිනවා.

ස්තුතියි.

## පරිසර අධ්‍යාපනයේ
## පොදු අරමුණු

1. සමස්ත පරිසරයත් සබැඳි ප්‍රශ්නත් පිළිබඳව

- සංවේදිතාව
- සතිමත් බව ඇති කරගැනීම

2. පරිසරය, සබැඳි ප්‍රශ්න, ඒවාට අදාළව මානව වර්ගයා ගේ භූමිකාව හා වගකීම පිළිබඳ

- දැනුම
- අවබෝධය දියුණු කර ගැනීම

3. පරිසරය සුරැකීමට හා ප්‍රශ්න විසඳීමට අදාළ

- කුසලතා ප්‍රගුණ කිරීම

4. එම ප්‍රශ්න විසඳීමට

- පෙළැඹීම
- සහභාගි වීම

5. පරිසරයට අදාළ වන වැඩ පිළිවෙළවල යෝග්‍යතාව ඇගැයීම

- පරිසර විද්‍යාත්මක සාධක අනුව
- දේශපාලනමය
- ආර්ථික
- සමාජයීය
- සංස්කෘතික
- සෞන්දර්යාත්මක

ජේ. පී. හේරත් මහතා,
අධ්‍යක්ෂ (විද්‍යා - ගණිත)
ජාතික අධ්‍යාපන ආයතනය,
මහරගම.

**ANNEX H**

**PARTICIPANTS AT THE**
**WORKSHOP ON IDENTIFICATION OF PROBLEMS & CONSTRAINTS IN CONSERVATION EDUCATION AT SCHOOL LEVEL**

**3rd November 1990**

---

**TEACHERS**

**Area - Badalkumbura**
(1) Mr R.M. Jayatilake, Nissanka M.V.
(2) Mrs L. Weeratunge, Nissanka M.V.

**Area - Badulla**
(3) Mr A. Dissanayake, Kandakepu Ulpatha M.V.
(4) Mr S.M. Abeykoone, Kandakepu Ulpatha M.V.
(5) Mr R.B.R. Weerasinghe, Badulla M.M.V.
(6) Mr H.T.P. Peiris, Badulla M.M.V.
(7) Mrs N. Wijekoone, Dharmadutha M.V.
(8) Mrs A.P. Herath, Dharmadutha M.V.
(9) Mrs C. Wickremage, Viyaluwa D.S. Senanayake M.M.V.

**Area - Bandarawela**
(10) Mr L.L. Jayasundera, Aththalapitya M.V.

**Area - Bibile**
(11) Mr K. Dissanayake, Wellassa M.M.V.
(12) Mr A.M. Ghanawardena, Nannapurawa M.V.
(13) Mrs D.M.S. Rukmani, " "
(14) Mr T.M.R. Wijesinghe, " "

**Area - Dambagalla**
(15) Mr D.M.V. Padmasiri, Ihawa Junior School

**Area - Dombagahawela**
(16) Mrs D.M. Wimalawathie, Kossalpola Junior School
(17) Mr P.M.N.B. Bandara, Kossalpola Junior School

**Area - Girandurukotte**
(18) Mr K.M.R.B. Kulasekera, Ulhitiya M.V.
(19) Mr D.M. Samarasena, Ulhitiya M.V.

**Area - Haldumulla**
(20) Mr K.M.S.J. Bandara, Soragune M.V.

**Area - Hali-Ela**
(21) Mrs D.F.S.P. Gunasekera, Uduwara M.V.
(22) Mr R.H. Chandrasiri, Uduwara M.V.

**Area - Lunugala**
(23) Mr A.M. Abeykoone, Lunugala M.V.
(24) Mr G.S. Jayamanne, Lunugala M.V.

**Area - Mahiyangana**
(25) Mr A.O.M. Chandrasiri, Tissapura M.V.
(26) Mrs D.M. Premawathie, Tissapura M.V.

**Area - Wellawaya**
(27) Mr K.S. Gunaruwan, Wellawaya M.V.

**Area - Welimada**
(28) Mrs W.M.C. Pathmalatha, Girambe Sri Kemananda, M.V.

**Area - Passara**
(29) Mr W. Ratnayake, Medawalagama M.V.

**Area - Monaragala**
(30) Mrs N.M. Vinitha, Monaragala Royal College
(31) Mrs A.P.N. Krishna, Monaragala Royal College
(32) Mr T.P.G. Bandara, Udikkapuara Junior School
(33) Mrs D.M.S. Dissanayake, Monaragala Kubukkana Junior School
(34) Mr R.M.A. Ratnayake, Mediriya M.V.
(35) Mr G.M. Ariyaratne, Kolonwinna Junior School
(36) Mr R.M. Dayananda, Kolonwinna Junior School
(37) Mr R.M. Premaratne, Mariarawa M.V.
(38) Mrs G.K.M. Wimalawathie, Mariarawa M.V.

**RESOURCE PERSONS**

(39) Dr S.W. Kotagama, Director, Deptarment of Wild Life Conservation, No. 82, Rajamalwatte Road, Battaramulla
(40) Dr (Miss) T. Peiris, March for Conservation, University of Colombo, Colombo 3.
(41) Mr J. Waththewidana, Open University, Nawala, Nugegoda
(42) Mrs U. Hettige, Forest Department, P.O. Box 509, Rajamalwatte Road, Battaramulla
(43) Miss N. Ranasinghe, March for Conservation, University of Colombo, Colombo 3
(44) Mr G.H. Gauthamadasa, National Institute of Education, Maharagama
(45) Miss J.D.S. Dela, Natural Resources, Energy & Science Authority, 47/5, Maitland Place, Colombo 7

**NARESA STAFF**

(46) Mr B.M.C.K. Basnayake Natural Resources, Energy & Science Authority, 47/5, Maitland Place, Colombo 7